ලංකාදීප.lk
අන්තර් ජාලයට එක්වූ ප්‍රථම සිංහල පුවත්පත

25 පෙබරවාරි 2006

---

මතවාද

# සටන් විරාම ගිවිසුම: පසුබිම හා අඩුපාඩු

නීතිඥ ශිරාල් ලක්තිලක

දැනට ක්‍රියාත්මක වෙමින් තිබෙන සටන් විරාමයට වසර හතරක් ගතවී තිබේ. සටන් විරාමය ඇතිකර ගැනීම සම්බන්ධයෙන් වූ ගිවිසුමට ශ්‍රී ලංකා රජයත්, එල්.ටී.ටී.ඊ. සංවිධානයත් අත්සන් කළේ 2001 වසරේ පෙබරවාරි 22 වැනිදාය. මෙම සටන් විරාම ගිවිසුම ලංකාවේ ප්‍රථම වරට ඇතිකරගත් සටන් විරාම ගිවිසුම නොවේ. මීට පෙරද විටින් විට තාවකාලික සටන් විරාම ඇති වුණි. එම සටන් විරාම ද්විපාක්ෂිකව මෙන්ම ඒකපාක්ෂිකව සිදු වූ ආකාරයක් දැක ගත හැකිය. ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ කාලයේදී තාවකාලික සටන් විරාමයක් ඇති වුණි. එය අසාර්ථක වීම වෙනම කරුණකි. එමෙන්ම 1994දී චන්ද්‍රිකා මැතිණිය ජනාධිපති වීමෙන් පසුව ද සටන් විරාමයක් පැවතුණි. එයද අසාර්ථක වුණි.

ඉන්පසුව 2000 වසරේ සිට ඒක පාක්ෂික සටන් විරාම ගණනාවක් එල්.ටී.ටී.ඊයෙන් ප්‍රකාශයට පත්විය. සාර්ථක සටන් විරාම ගිවිසුමක් ආරම්භ වූයේ 2001 වසරේදීය. එය වර්තමානයේද ක්‍රියාත්මක වෙමින් පවතී. සටන් විරාම ගිවිසුමක් යනු සර්වතෝභද්‍ර හෝ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්නක් යැයි මෙයින් අදහස් කෙරෙන්නේ නැත. යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් අවිවලින් කතා කරන පාර්ශ්ව දෙකක් දේශපාලනිකව කතා කිරීමට මෙකී පාර්ශ්ව දෙක අවි ගැටුමින් තාවකාලිකව මුදවා ගැනීම අවශ්‍යය. සටන් විරාමයකින් කෙරෙන්නේ ඒ ආකාරයට දෙපාර්ශ්වය වෙන් කිරීමකි. සටන් විරාම ගිවිසුම සමග සාමය උදාවූ බවට ශ්‍රී ලංකා සමාජයේ මතයක් තිබේ. එසේ සාමය උදාවන්නේ නැත. සටන් විරාමයක් තිබෙන කාලය යුද්ධයක් නැති සාමයක් නැති වකවානුවකි. එය ගන්ධබ්බ අවදියක් වැනි තත්ත්වයකි.

2004 සටන් විරාම ගිවිසුමට යම් පසුබිමක් තිබේ. ජය සිකුරු මෙහෙයුමෙන් පසුව යාපනය අල්ලා ගැනීමත් සමග "ඒ නයින්" මාර්ගය අල්ලා ගැනීමට කළ දීර්ඝ සටන් පෙළක් අවසන් වුණි. ජයසිකුරු මෙහෙයුමද අවසන් වුණි. තවත් පැත්තකින් එලිෆන්ට්පාස් කඳවුර දැඩි

ත්‍රස්ත ප්‍රහාරයකට ලක්වී විනාශ විය. ඉන්පසුව යාපනය අල්ලා ගැනීම සඳහා එල්.ටී.ටී.ඊ.ය මෙහෙයුමක් දියත් කළේය. එය ජය පරාජයකින් තොරව නතර වුණි. යාපනය අල්ලා ගැනීමේ උපක්‍රමය නතර කළ එල්.ටී.ටී.ඊ.ය ඉන්පසුව කළේ ලංකාවේ ආර්ථික මර්මස්ථානවලට පහර දීමය. කටුනායක ගුවන්තොටුපොළට ප්‍රහාර එල්ලවූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. වසර විස්සකට අධික කාලයක් මිලිටරි යුද්ධයක් පැවතියද, මෙරට ආර්ථික සමාජ සංවර්ධනයට එතරම් බලපෑමක් වූයේ නැත. ආර්ථික අවපාතයක් තිබුණේ නැත. නමුත් කටුනායක ගුවන් තොටුපොළට ප්‍රහාරය එල්ල වීමත් සමග මෙරට ආර්ථිකයේ අවපාතයක් ඇති වුණි. එය ශ්‍රී ලංකා රාජ්‍ය ඉතිහාසයේ බරපතල අවස්ථාවකි. ආර්ථිකය සෘණ වර්ධකයක් බවට පත්වීම එයට හේතුව වශයෙන් පෙන්වා දිය හැකිය. සටන් විරාමයකට යාමට හේතුව කුමක්ද යන්න සොයා බැලීමේදී මෙකී කරුණු තේරුම් ගත යුතුය.

කෙසේ හෝ සටන් විරාම ගිවිසුම අත්සන් කෙරුණි. එදා සිට අද දක්වාම එය ක්‍රියාත්මක වෙමින් පවතී. සටන් විරාමයේ විවිධ උල්ලංඝනද සිදුවන බව නොරහසකි. මේ සිදුවීම් පිළිබඳ තක්සේරුවකට යාමට ප්‍රථම සටන් විරාම ගිවිසුමේ තිබෙන මූලික ස්වරූපය හඳුනාගත යුතුය. මෙහි ප්‍රධාන වශයෙන් පූර්විකාවක් සමග වගන්ති හතරක් ඇතුළත්ය. එනම් රජයත් එල්.ටී.ටී.ඊ. සංවිධානයත් අත්සන් තබා තිබෙන්නේ කොටස් පහකින් සමන්විත ගිවිසුමකටය.

එහි පළමුවැනි වගන්තියෙන් දක්වා තිබෙන්නේ සටන් විරාමය ඉදිරියට පවත්වාගෙන යන්නේ කෙසේද යන්නය. දෙවැනි හා තුන්වැනි වගන්තිවල සඳහන් වන්නේ දෙපාර්ශ්වය අන්‍යොන්‍යව ඉටු කළ යුතු යුතුකම්ය. විශ්වාසය ගොඩනැගීමේ ක්‍රියාවලිය වශයෙන් මෙය පෙන්වා දීමට පුළුවන. හතරවැනි වගන්තිය වශයෙන් දක්වා තිබෙන්නේ සටන් විරාම උල්ලංඝනයක් සිදු වුවහොත් සටන් විරාම නිරීක්ෂණ කණ්ඩායමක් ගොඩනගා ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්නයි. මේ දක්වා සටන් විරාමය ක්‍රියාත්මක වූයේ මේ ඔස්සේය.

මෙහි පළමුවැනි වගන්තිය ක්‍රියාත්මක වුවද, දෙක සහ තුන වගන්ති අන්‍යොන්‍යව ඉටුකිරීම සම්බන්ධයෙන් දෙපාර්ශ්වයෙන්ම දුක්ගැනවිලි තිබේ. අදත් කතා වෙන්නේ ඒ සම්බන්ධයෙනි. රජයේ කණ්ඩායම් නියෝජිතයා ජිනීවා සාකච්ඡාවලදී ප්‍රකාශ කර තිබෙන්නේ සටන් විරාම ගිවිසුම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත්, ශ්‍රී ලංකාවේ ස්වාධිපත්‍යයටත් එරෙහිව ගොඩනැගුණක් වුවත්, එහි ඇතිවී තිබෙන ධනාත්මක ප්‍රතිඵල අගය කළ යුතු බවය. මෙහි සඳහන් කරුණු දෙකම වැදගත්ය. සටන් විරාම ගිවිසුම නීත්‍යානුකූලද යන්න එක් පැත්තකින් මතුවන ප්‍රශ්නයකි. ලංකාවේ ස්වාධිපත්‍යයට එරෙහි වී ඇති බවද ඇමැතිවරයාගේ ප්‍රකාශයේ සඳහන්ය.

සටන් විරාම ගිවිසුම ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිද නැද්ද යන්න සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් විභාගවෙමින් තිබේ. නමුත් සුනාමි සහන මණ්ඩලය සම්බන්ධව ලබාදුන් නඩු තීන්දුවේදී පැහැදිලිව දක්වා තිබෙන්නේ අකුරුනා රීතිය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කළහොත් මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරන බවය. එහෙත් ඊට වඩා වැඩි පසුබිමක යථාර්ථවාදීව සලකන විට එය නීත්‍යානුකූල බව ශ්‍රේෂ්ඨාධිකරණය පිළිගෙන තිබේ. ඒ ප්‍රකාශය නෛතිකව සලකා බැලීමකට ලක් කළ යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පිටතින් ගොස් සටන් විරාම ගිවිසුම අත්සන් කළාද යන ප්‍රශ්නය මතු කළහොත් දිය හැකි එකම පිළිතුර "ඔව්" යන්නය. නමුත් එසේ වීමට හේතුව කුමක්දැයි සොයා බැලිය යුතුය. ඒ පිළිබඳව වැඩි වැඩියෙන් ශ්‍රී ලංකා සමාජයේ අවධානය යොමු විය යුතුව තිබේ. ඕනෑම රටක ජාතික රාජ්‍යයේ නීතියේ ආධිපත්‍යය සියලු දෙනාට එකසේ බලපෑ යුතුය. යථාර්ථය එයයි. නමුත් අනුභූතිකව එල්.ටී.ටී.ඊ. නමැති සංවිධානය මේ රටේ ක්‍රියාත්මකය. ඔවුන් රජයත් සමග නොනිමි යුද්ධයක පැටලී සිටී. මෙවැනි අවස්ථාවක සාමය ගොඩනැගීමට කටයුතු කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි යැයි සිතා ඔවුන් සමග ගනුදෙනු නොකර සිටියහොත් ඇති විය හැකි තත්ත්වය කුමක්ද? මෙවැනි අවස්ථාවක කරන්නට තිබෙන්නේ එක් දෙයකි. එනම් යුද්ධ කිරීමය.

යුද්ධයකදී දෙපාර්ශ්වය ආමන්ත්‍රණය කරන භාෂාව වන්නේ උණ්ඩය මිස වචන නොවේ. එම උණ්ඩය වෙනුවට ශීලාචාර සමාජයක ගනුදෙනු කරන ආකාරයට සාකච්ඡා මාර්ගයකට යාමට නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව හෝ සටන් විරාම ගිවිසුමක් අත්සන් කිරීමට සිදුවනු ඇත. සිදුවී ඇත්තේ එවැන්නකි. සටන් විරාම ගිවිසුම සර්වතෝභද්‍ර යන්න අනෙක් ගැටලුව ලෙස පෙන්වා දිය හැකිය. එසේ නැතිනම් මෙය හැම කාලයටම අදාළද යන්නයි. එය එසේ නොවන බව සෑම අවස්ථාවකම ඔප්පු කර තිබේ. අද වන විට සටන් විරාමයේ යම් යම් දුර්වලතා පෙන්නුම් කරමින් තිබෙන්නේ ඒ හේතුවෙනි. මෙකී දුර්වලතා කාණ්ඩ ගණනාවක් තිබේ. ඕනෑම සටන් විරාම ගිවිසුමක් සහ සාම සාකච්ඡාවක් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් තිබේ. දෙපාර්ශ්වය සාකච්ඡා නොකරන්නේ නම් සටන් විරාම ගිවිසුමක් පැවතිය නොහැක. යම් උල්ලංඝනයක් වේ නම් ඒ සම්බන්ධයෙන් දෙපාර්ශ්වය සාකච්ඡා කළ යුතුය. නමුත් අවාසනාවකට මෙන් මෙවැනි උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් දෙපාර්ශ්වය අන්‍යෝන්‍යව සාකච්ඡා කරන ආකාරයේ යාන්ත්‍රණයක් මෙම සටන් විරාමයේ නොමැත. තිබෙන්නේ නිරීක්ෂණය කිරීම පමණි. මේ නිසා බරපතළ ආකාරයෙන් විශ්වාසය කඩවෙමින් තිබේ.

බර්ලින් නුවර සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී එල්.ටී.ටී.ඊ. යාත්‍රාවකට එල්ල කළ නාවික හමුදා ප්‍රහාරය මෙයට හොඳම උදාහරණය වශයෙන් පෙන්වා දිය හැකිය. සටන් විරාමයේ වාසනාවට දෙපාර්ශ්වයම බර්ලින් නුවර සිටියහ. එනිසා සාකච්ඡා කර එම ප්‍රශ්නය විසඳා ගැනීමට ඔවුන්ට හැකියාව ලැබුණි. සටන් විරාමය රැකීමටද එය බලපෑවේය. එය අහඹුවක් පමණි. ඒ හැරෙන්නට සටන් විරාමය උල්ලංඝනය වූ අවස්ථාවල සාකච්ඡා කිරීම් සිදුවූයේ නැත. එය සටන් විරාමයේ තිබෙන බරපතළ දුර්වලතාවකි. ගැටුම් නිරාකරණ යාන්ත්‍රණයක් මේ තුළ නොමැත.

සටන් විරාමය නිරීක්ෂණයේදී සමාජයේ සාමූහික සහභාගිත්වය අත්‍යවශ්‍යය. සිවිල් සමාජයේ මානව හිමිකම් පිළිබඳ උනන්දු වන්නන්, සාම කමිටු ආදී සිවිල් ජනතාව මෙම නිරීක්ෂණයට සහභාගි විය යුතුය. සටන් විරාමයේ උල්ලංඝන සිදුවනවාද නැද්ද යන්න පුළුල්ව සාකච්ඡා කිරීමට අවස්ථාව ලැබෙන්නේ එවැනි පසුබිමකය. නමුත් අවාසනාවකට මෙම සටන් විරාම ගිවිසුමේ එවැනි විධිවිධානයක් නොමැත. නිරීක්ෂණ කටයුත්ත සම්පූර්ණයෙන්ම බාර කර තිබෙන්නේ විදේශ කණ්ඩායමකටය. මේ නිසා බරපතළ ප්‍රශ්න දෙකක් ඇතිවේ. මේ ගිවිසුම ජාත්‍යන්තර ගිවිසුමකි. ජාත්‍යන්තර නීතිය අනුව ගිවිසුමක් දෙස බලන විට එය දේශීය නීතියට වඩා වෙනස්ය. දේශීය නීතිය අනුව ගිවිසුමක් අත්සන් කර එය කඩ කළ හොත් උසාවි යාමට පුළුවන. ඒ අනුව යම් යම් ක්‍රියාමාර්ග ගැනීමට පුළුවන. නමුත් ජාත්‍යන්තර ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට ජාත්‍යන්තර නීතියේදී පොලිසියක් හෝ උසාවියක් නොමැත. මෙය ලංකාවට පමණක් බලපාන තත්ත්වයක් නොවේ. පොදු කරුණකි. මේ සඳහා ජාත්‍යන්තර නීතිය හැම විටම භාවිතා කරන්නේ ලංකිරීම හා ලජ්ජා කිරීමය. යම් සිද්ධියක් වූ විට ඒ සම්බන්ධයෙන් ජනමතයක් ගොඩනගා එය ලෝක මතයක් බවට පත්වී යම් බලපෑමක් පාර්ශ්ව කරුවන්ට එල්ල වනු ඇත. මේ නිසා අදාළ ගිවිසුම් උල්ලංඝනයට බොහෝ විට අකමැතිය. ජාත්‍යන්තර නීතියේ ගිවිසුම් ක්‍රියාත්මක වන්නේ මෙවැනි අලිඛිත පසුබිමකය. මෙය ලංකාවේ සටන් විරාමයටද බලපා තිබේ.

නිරීක්ෂණයට ජන සහභාගිත්වය නොමැතිවීම හේතුවෙන් සිදුවන සිද්ධි ජාත්‍යන්තරකරණය වන්නේ නැත. සිදුවන්නේ ඒකපාක්ෂිකව සිද්ධි ඉදිරිපත් කිරීමකි. මෙය එක්තරා ආකාරයකට දෙපාර්ශ්වය කරනු ලබන රණ්ඩුවකි. පොදු මතයක් වශයෙන් ඉදිරිපත්වන්නේ නැත. මෙකී දුර්වලතාව සකස් ගර ගැනීම සඳහා සටන් විරාම නිරීක්ෂණය ජනතාකරණය කිරීම අත්‍යවශ්‍ය සාධකයකි.

එමෙන්ම උල්ලංඝනයක් සිදුවන විට එයට පොදු අර්ථනිරූපනයක් ඇති කර ගැනීමද අවශ්‍ය වන්නකි. යම් මිනිස් ඝාතනයක් සිදුවන්නේනම් එසේ වූයේ ඇයිද යන්න දෙපාර්ශ්වයම එකඟ වන පොදු ධර්මතා තිබිය යුතුය.

එසේ නොමැති වීම හේතුවෙන් එක් පාර්ශ්වයක් සටන් විරාමය උල්ලංඝනය කරන විට අනෙක් පාර්ශ්වය ඒ දෙස බලන්නේ චෝදනා මුඛයෙකි. එනිසා සටන් විරාම ගිවිසුම උල්ලංඝනය සම්බන්ධව පොදු මිනුම් දඬු ගණනාවක් ගොඩනගා ගැනීමේ අවශ්‍යතාව මතුව තිබේ. එසේ නොවනතාක් සටන් විරාමය සමග වෙට්ටු දැමීමට එකිනෙකාට පුළුවන.

සටන් විරාම ගිවිසුමේ තිබෙන මූලික කොන්දේසි උල්ලංඝනය වී තිබේද යන්න සොයා බැලීමද කාලෝචිතය. දෙවැනි හා තුන්වැනි වගන්ති යටතේ දෙපාර්ශ්වය ඉටු කළ යුතු යුතුකම් නිසි පරිදි ක්‍රියාවට නංවා නොමැති බව කියමින් එකිනෙකාට චෝදනා කරගන්නා ආකාරයක්ද දැක ගත හැකිය. ජිනීවා සාකච්ඡාවලදී කණ්ඩායම් දෙකේ නායකයන් ඉදිරිපත් කර ඇති කරුණුවලින්ම එය සනාථ කරගත හැකිය.

මේ පසුබිම යටතේ ගැටලුව විසඳන්නේ කෙසේද යන්න ප්‍රශ්නයකි. එක් කොටසකගේ අදහස වී තිබෙන්නේ සටන් විරාම ගිවිසුම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව අත්සන් කර තිබෙන බවය. නමුත් එහි හොඳ ප්‍රතිඵල තිබෙන බවය. එසේ කැපකිරීම් කර තිබෙද්දීත් එල්.ටී.ටී.ඊ.ය විශාල වශයෙන් සටන් විරාමය උල්ලංඝනය කර තිබේය යන්නය. එයට සමගාමීව එල්.ටී.ටී.ඊ.ය ප්‍රකාශ කරන්නේ සටන් විරාම ගිවිසුම ඉතා හොඳ බවකි. ඒ තුළ ක්‍රමිකව, විශ්වාසය ගොඩනැගීම සිදුවිය යුතුය. නමුත් රජයට වගකීමක් වශයෙන් පැවරී තිබෙන බොහෝ දේ ඉටුකර නැත යන්න එල්.ටී.ටී.යෙන් නැගෙන චෝදනාය. මෙය එක්තරා ආකාරයකට දත්ත ගැටුමකි. සටන් විරාමය ඉදිරියට ගෙනයාමට සහ අනාගත සාකච්ඡා පැවැත්වීම තීරණය වන්නේ මෙම ගැටලුව ලිහාගැනීම මතය.

ගැටුම් නිරාකරණය මාර්ගයෙන් මෙයට විසඳුම් සොයන්නේනම් දෙපාර්ශ්වයම කරුණු කීපයකට එකඟ විය යුතුය. සටන් විරාම ගිවිසුමේ තිබෙන වගන්ති දෙපාර්ශ්වයේම අදාළත්වය පිළිබඳ එකඟතාවක් ඇති කර ගත යුතුය. එහිදී එකිනෙකාට සුවිශේෂ වූ වගකීම් තේරුම් ගැනීම අත්‍යවශ්‍යය. එවැනි එකඟතාවකින් පසු යම් යම් පොදු මිනුම් දඬු කීපයක් ඇති කර ගත යුතුය. අධි ආරක්ෂක කලාප ඉවත් කිරීම, ළමා සොල්දාදුවන් බඳවා ගැනීම ආදිය සම්බන්ධයෙන් එවැනි පොදු මිනුම් දඬු අවශ්‍යය. දැනට පවතින දත්තමය ගැටුමෙන් එළියට යා හැක්කේ ඒ මත පමණි.

එල්.ටී.ටී.ඊ.ය ඉල්ලා සිටින්නේ සටන් විරාම ගිවිසුම ශක්තිමත් කිරීමටය. නමුත් ශ්‍රී ලංකා රජය යම් ආකාරයකට ව්‍යංගයෙන් උත්සාහ කරන්නේ සටන් විරාම ගිවිසුමට අලුත් දේ එකතු කිරීමටය. රජය ගන්නා මේ උත්සාහය භයානක වූවකි. සටන් විරාම ගිවිසුමට පෙර අප පිළිගැනීමට කැමැති හෝ අකමැති අනුභූතික යථාර්ථයක් තිබුණි. ඇතැම් අය මෙය

පිළිගැනීමට කැමැති නැත. යුද්ධයෙන් එල්.ටී.ටී.ඊ.ය පරාජය කිරීමට නොහැකි වීම ඉන් එකකි. ඒ වගේම එල්.ටී.ටී.ඊ.යට අපව යුද්ධයෙන් පරාජය කිරීමට හැකි වූයේ නැත. අනෙක් පැත්තෙන් යුද්ධය හේතුවෙන් අපේ ආර්ථිකයට බරපතළ හානි සිදු වුණි. 2001දී සටන් විරාම ගිවිසුම අත්සන් කෙරුණේ මෙකී සියලු කාරණා පදනම් කරගෙනය. මෙහිදී ඉතා වැදගත් කරුණක් සටන් විරාම ගිවිසුමේ ආරක්ෂා වී තිබේ. ශ්‍රී ලංකා ජාතික රාජ්‍යය, දේශසීමාවලට ඇති අයිතිය තිබෙන බව සටන් විරාම ගිවිසුම පිළිගෙන තිබේ. වඩදිය මට්ටමේ සිට සැතපුම් 12 වන දේශීය ජල තීරය අපට අයිති බව මෙහි පිළිගෙන තිබේ. නමුත් විවේචකයන් කියා සිටින්නේ එල්.ටී.ටී.ඊ. පාලන ප්‍රදේශ පිළිගෙන ඇති බවය. නමුත් දේශීය ජල තීරය ජාතික රාජ්‍යයට අයිති බව පිළිගැනීම ඊට වඩා වාසිදායකය. එල්.ටී.ටී.ඊ.ය නිරන්තරයෙන්ම උත්සාහ කරන්නේ මේ ජල තීරයේ ඔවුන්ගේ නාවික පථයක් සකසා ගැනීමටය. සටන් විරාම ගිවිසුම යම් හෙයකින් විවෘත කළහොත් එල්.ටී.ටී.ඊ.ය මේ ජල තීරය ඉල්ලා සිටියහොත් ඇති විය හැකි තත්ත්වය කුමක්ද? ශ්‍රී ලංකාවේ ජාතික අභිවෘද්ධිය වෙනුවෙන් රජයේ අනෙක් පාර්ශ්වකරුවන් මේ තත්ත්වය වටහා ගත යුතුය. සටන් විරාම ගිවිසුම නැවත සාකච්ඡාවට භාජන කළහොත් ජාතික රාජ්‍යයේ වාසියට තිබෙන පදනම් ගණනාවක් අර්බුදයට ලක්වීමට පුළුවන. එනිසා සටන් විරාම ගිවිසුම මේ ආකාරයටම පවත්වා ගනිමින් ඒ මත සිටිමින් එය ශක්තිමත් කරමින් ජාතික රාජ්‍යයේ මූලෝපායික අවශ්‍යතා ක්‍රමානුකූලව දිනාගැනීමට කටයුතු කිරීම වඩා සුදුසුය.

සටන් විරාම ගිවිසුම ඔස්සේ අපට වාසිසහගත ගමනක් යාමට පුළුවන. එනිසා මෙම ගිවිසුම නොවැදගත් අපට අවාසි සහගත වූවක් වශයෙන් නොසලකා මෙය ජයග්‍රහණයක්සේ සලකා කටයුතු කරනවානම් වඩා හොඳ ප්‍රතිඵල ලබා ගත හැකිය. එහිදී සටන් විරාමයට සාපේක්ෂව සාකච්ඡා පැවැත්විය යුතුය.

යුද්ධයට සාපේක්ෂව මෙම සටන් විරාම ගිවිසුම වඩා හොඳ බව බොහෝ දෙනා පිළිගන්නා කරුණකි. සාමය සඳහා එතරම් යෝග්‍ය නොවන ස්ථාවරයක සිටින වත්මන් රජයට පවා සාකච්ඡාවලට යාමට හැකි වූයේ සටන් විරාමය හේතුවෙනි. තිබෙන අඩුපාඩු සකසා ගනිමින් ඉදිරියට යා යුතුය. මෙවැනි ගිවිසුම් යම් යම් ආකාරයට උල්ලංඝනය වීම අප රටට සීමා වන්නක් නොවේ. එනිසා පවතින ගැටලුවට විසඳුම් සෙවීමේදී සටන් විරාම ගිවිසුම පවත්වාගෙන යාමත්, එයට අවශ්‍ය ශක්තිය දීමත් කළ යුතුය.